මගේ අංකය - RG/MBD/6/20/5.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,

අංක 234/ඒ 3,

ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,

බත්තරමුල්ල.

2024/02/12

දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්,

.....බදුල්ල.....

~~උප්පැන්න, මරණ හා~~ විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු වල පුරප්පාඩු පිරවීම

.....බදුල්ල..... දිස්ත්‍රික්කය

ඔබ දිස්ත්‍රික්කයේ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු වල පුරප්පාඩු පිරවීමට අදාළ ඉල්ලුම්පත් කැඳවීම සඳහා මවිසින් රජයේ මුද්‍රණාලය වෙත යවන ලද උපලේඛනයේ පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවමි. මෙම නිවේදනය 2024 .....මාර්තු..... මස .....01..... දින ගැසට් පත්‍රයේ පලවනු ඇත.

02. මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් බාර ගැනීමේ අවසාන දිනය 2024 .....අප්‍රේල්..... මස .....01..... දින වේ. ඒ අනුව ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීම කොට්ඨාසය තුල ප්‍රසිද්ධ කිරීම සඳහා සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් සකසන ලද ලියාපදිංචි ආ 74 දරණ දැන්වීම් ආකෘති පත්‍ර මේ සමඟ ඔබ වෙත එවමි.

03. මෙම දැන්වීම ඔබ කාර්යාලයේ , ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල වල, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යල වල සහ කොට්ඨාස තුල පිහිටි ග්‍රාම නිලධාරි කාර්යාල , සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල සහ තැපැල් කාර්යාල ආදී ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කරවීමට අවශ්‍ය පියවර ගන්න.

04. එසේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීම සඳහා යැවීමට පෙර එම දැන්වීම් වල පහත සඳහන් විස්තර ගැසට් නිවේදනයේ සඳහන් අන්දමට ඇතුලත් කරන්න.



...... 2 පිටුවට

අ)  දැන්වීමේ ශීර්ෂයේ "අදාළ දිස්ත්‍රික්කය සහ උප්පැන්න , මරණ කොට්ඨාසයේ සහ විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයේ නම"

ආ)  බඳවා ගැනීමේ මාධ්‍යය සුදුසු පරිදි

ඇ)  දැන්වීමේ දෙවන ඡේදයේ ඉල්ලුම්පත් බාර ගන්නා අවසාන දිනය

ඈ)  දැන්වීමේ 03 (ii) ඡේදයේ අදාළ වන පරිදි උප්පැන්න, මරණ කොට්ඨාසයේ හෝ විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයේ නම

05. දැන්වීම සමඟ අමුණා ඇති "ඇමුණුම I" හි අදාළ පරිදි ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුලත් කරන්න (එලෙස සම්පූර්ණ කර ප්‍රදර්ශනය කරන ලද දැන්වීමෙහි හා ගම් ලැයිස්තුවෙහි පිටපතක් දැන්වීම පලකර සතියක් ඇතුළත මා වෙත එවිය යුතු බවද කාරුණිකව දන්වමි).

06. මේ අනුව ඔබ වෙත ලැබෙන ඉල්ලුම්පත් දින මුද්‍රා යොදා පිළිවෙලට උපලේඛන ගත කර , අවශ්‍ය ඉදිරි පියවර ගන්නා මෙන් දන්වමි.

07. දෙපාර්තමේන්තු අත්පොතේ 25 වන නියෝගයේ සඳහන් කාල උපලේඛනය අනුව ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන, ඔබගේ අවසන් නිර්දේශය නියමිත දිනට මා වෙත එවන මෙන්ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

08. තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට භාවිතා කල යුතු අයදුම්පත්ද මේ සමඟ එවන අතර අයදුම්පත සමඟ ලියාපදිංචි ආ 74 දරණ දැන්වීම් ආකෘති පත්‍රය සහ "ඇමුණුම I" ද සියලුම අයදුම්කරුවන්ට ලබා දෙන්න. මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය මම අතිශයින් අගය කරමි.

අත්/කළේ:- ඩබ්.ආර්.ඒ.එන්.එස්.විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්

සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් -

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය. - කා.දැ.ස.
2. ......ඌව සබරගමුව....... කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් - දැ.ගැ.ස.
3. ......බදුල්ල......... දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් - දැ.ගැ.ස. සහ අ.ක.ස.
4. ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ,......බදුල්ල........ - දැ.ගැ.ස. සහ අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ,......හාලිඇල...... - දැ.ගැ.ස. සහ අ.ක.ස.
6. තොරතුරු තාක්ෂණ අංශය - දැ.ගැ.ස. සහ පුරප්පාඩු වෙබ් අඩවියේ පල කිරීම සඳහා.

## උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| බදුල්ල | හාලිඇල | උඩුකිඳ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් ,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,බදුල්ල |
| බදුල්ල | හාලිඇල | මාලිගාතැන්න කොට්ඨාසයේ උප්පැන්න හා මරණ හා උඩුකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් ,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,බදුල්ල |